// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2091/77 - 2018 ඔක්තෝබර් මස 06 වැනි සෙනසුරාදා - 2018.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාත් සභාවේ 2018 අංක 03 දරන මධ්‍යම පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව මගින් 2018 ඔක්තෝබර් මස 02 වැනි දින ගරු සභාවට ඉදිරිපත් කරන ලද 2018 අංක 03 දරන මධ්‍යම පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ යෝජිත ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ අතර ඊට 2018.10.06 වැනි දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළකරමි.

එදිරිවීර වීරවර්ධන,
මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති
සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය,
මධ්‍යම පළාත.

තැ. පෙ. 104,
අංක 109, යටිනුවර වීදිය,
මහනුවර.

1A - PG 3876 — 22 (2018/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**මධ්‍යම පළාතේ ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය**

මධ්‍යම පළාත ඇතුළත මෝටර් රථ වාහන භාවිතා කොට පාරවල් ඔස්සේ භාණ්ඩ හා සේවා සහ මගීන් ගෙන යාම සඳහාද, මාර්ගස්ථ ප්‍රවාහන සේවාවන්ද සහ මධ්‍යම පළාතට අදාළ වන ප්‍රමාණයට මධ්‍යම පළාත හා සම්බන්ධ වන අන්තර් පළාත් ප්‍රවාහන සේවාවන්ද කළමනාකරණය කිරීම සඳහාද, එකී කළමනාකරණය කිරීමේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා මධ්‍යම පළාත සඳහා ප්‍රවාහන සේවා අධිකාරියක්, පිහිටුවීම සඳහාද ඒ සම්බන්ධයෙන් හෝ ඊට අනුෂාංගික කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම සඳහා සහ 1992 අංක 4 දරන මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය සහ 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය හා ඊට සම්බන්ධ සංශෝධන අවලංගු කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය.

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ 2018 අංක 03 දරන ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය යන නමින් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේය.

1 වැනි කොටස

**මධ්‍යම පළාතේ ප්‍රවාහන සේවා අධිකාරිය**

2. 1992 අංක 4 දරන මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය සහ 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ,

ප්‍රවාහන සේවා අධිකාරිය.

3 (1) මෙහි මින් මතු අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියක් පිහිටුවනු ලැබේ.

(2) ඉහත 3(1) උප වගන්තිය මගින් අධිකාරියට ලබාදී ඇති නාමයෙන් එය සංස්ථාපිත ආයතනයක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, අධිකාරියේ නාමයෙන් එය විසින්ද එයට එරෙහිවද නඩු පවරනු ලැබිය හැකිය.

අධිකාරියේ සාමාජිකයින්.

4 (1) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය එකොළොස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, එයින් පස් දෙනෙකු නිල බලැති සාමාජිකයින්ද, හය දෙනෙකු පත්කළ සාමාජිකයන්ද විය යුතුය.

අධිකාරියේ සියලු සාමාජිකයින් අමාත්‍යවරයාගේ අත්සනින් නිකුත් කරනු ලබන ලිපියක් මගින් විධිමත්ව පත් කරනු ලැබිය යුතු වන්නේය. එවැනි සියලු පත්වීම් රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුත්තේය.

(2) (i) නිල බලයෙන් "පත්වන සාමාජිකයින්" පහත පරිදි විය යුතුය ;

(අ) මධ්‍යම පළාත් ප්‍රවාහන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන විධායක මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු,
(ආ) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් නම් කරනු ලබන පළාත් භාණ්ඩාගාරයේ විධායක මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු,
(ඇ) මධ්‍යම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන සහකාර පොලිස් අධිකාරි නිලයට නොඅඩු නිළධාරියෙකු,
(ඈ) මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරනු ලබන සහකාර පළාත් පාලන කොමසාරිස්වරයෙකු,
(ඉ) මධ්‍යම පළාත් ප්‍රවාහන කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරනු ලබන එම දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයෙකු.

(ii) "පත් කළ සාමාජිකයින්" පහත පරිදි විය යුතුය ;

(අ) ප්‍රවාහනය, නීතිය, කළමනාකරණය, වාණිජ, පරිපාලනය හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එකක හෝ වැඩි ගණනක සුදුසුකම් ලබා ඇත්තාවූද, එම

විෂයයන් පිළිබඳ මනා පළපුරුද්දක් හා දක්ෂතාවයක් දක්වා ඇත්තා වූ බවට විෂයභාර අමාත්‍යවරයා සෑහීමකට පත්වන පුද්ගලයින් හතර දෙනෙකු,

(ආ) භාණ්ඩ හෝ මගී ප්‍රවාහනය කරන්නන් නියෝජනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් තම අභිමතය මත තෝරාගනු ලබන පුද්ගලයන් දෙදෙනෙකු,

5 (1) අමාත්‍යවරයා විසින් ඉහතින් පත් කරන ලද සාමාජිකයන් අතරින් එක් සාමාජිකයකු අධිකාරියේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතුය. *අධිකාරියේ සභාපති.*

(2) සභාපතිවරයාගේ ධුර කාලය ඔහු අධිකාරියේ සාමාජිකත්වය දරන කාල සීමාව හා අමාත්‍යවරයාගේ ප්‍රසාදය ඇති තාක් කල් විය යුතුය.

(3) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් අශක්නුතාවයක් නිසා සභාපතිවරයාට තම ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වශයෙන් වැඩ බැලීම සඳහා සිටින සාමාජිකයින් අතරින් කෙනෙකු පත් කරනු ලැබිය යුතුය.

6. මෙම ප්‍රඥප්තියෙන් ප්‍රවාහන සේවා අධිකාරිය වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීමේ බලය සභාපතිවරයා සතු වන්නේය. *සභාපතිවරයාගේ වගකීම්.*

7. (1) සභාපතිවරයාගේ ධුරය පහත දැක්වෙන හේතු එකක් හෝ කිපයක් නිසා අවසන් විය යුතුය. *සභාපතිවරයාගේ ධුරය හිස්වීම.*

(i) 12 වන වගන්තිය ප්‍රකාරව අධිකාරියේ සාමාජිකත්වය සඳහා නුසුදුස්සකු වීම ;
(ii) තම අත්සන යටතේ අමාත්‍යවරයාට යවන ලිපියක් මගින් ඉල්ලා අස්වීම ;
(iii) අමාත්‍යවරයා විසින් හේතු දක්වා ඉවත් කිරීම ;
(iv) මිය යෑම ;

(2) ඉහත ආකාරයට පුරප්පාඩු වන සභාපති ධුරය සඳහා විෂයභාර අමාත්‍යවරයා විසින් ස්ථිර සභාපතිවරයෙකු පත් කරන තෙක් ප්‍රවාහන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අධිකාරියේ සභාපති ලෙස වැඩ බැලීම සඳහා විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය.

8. (1) අමාත්‍යවරයා විසින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් යම් තැනැත්තකු පත් කිරීමට පෙර එම තැනැත්තා විසින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් තම කර්තව්‍ය ඉටු කිරීමේදී අහිතකර බලපෑමක් ඇති වීමට ඉඩ ඇති අධිකාරියේ කටයුතුවලට අදාළ මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් එම තැනැත්තාට නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත්විය යුතුය. *සාමාජිකයන්ගේ මූල්‍ය සම්බන්ධතාව.*

(2) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු එම ධුරයට පත් කරනු ලැබීමෙන් පසු එවැනි යම් සම්බන්ධතාවයක් අත් කර ගෙන නොමැති බවට අමාත්‍යවරයා කලින් කල සෑහීමට පත්විය යුතුය.

(3) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට අමාත්‍යවරයා විසින් යෝජනා කරන යම් තැනැත්තෙක් අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා ඉල්ලීමක් කරනු ලබන කවර හෝ අවස්ථාවකදී , මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම් තොරතුරක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(4) අධිකාරිය විසින් ඇති කර ගනු ලබන හෝ ඇති කර ගැනීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව යම් ආකාරයකින් ඍජුව හෝ අන්‍යාකාරයකට සම්බන්ධතාවයක් දක්වන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු විසින් තමාගේ සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳව අධිකාරියේ රැස්වීමකදී හෙළිදරව් කළ යුතුය. එසේ හෙළිදරව් කිරීම අධිකාරියේ රැස්වීම් වාර්තාවල වාර්තාගත කළ යුතු අතර, එම ගිවිසුම සම්බන්ධයෙන් අධිකාරිය විසින් පවත්වනු ලබන යම් සාකච්ඡාවකට හෝ අධිකාරිය විසින් ගනු ලබන යම් තීරණයකට එම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා සහභාගි නොවිය යුතුය.

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්.

9.(1) අධිකාරියේ සෑම අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමකදීම සභාපතිවරයා මුලසුන දැරිය යුතුය. සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවකදී පැමිණ සිටින සාමාජිකයින් විසින් ඔවුන් අතරින් යම් තැනැත්තකු එම රැස්වීම සඳහා පමණක් සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතුය.

(2) අධිකාරියේ යම් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක ගණපූර්ණය හය දෙනෙකු විය යුතුය.

(3) අධිකාරිය විසින් සළකා බැලීම සඳහා ඉදිරිපත් වන සෑම කරුණක්ම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී තීරණය කළ යුතු අතර, එම කරුණු රැස්වීමට පැමිණි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ බහුතරයක් විසින් අනුමත කරනු ලැබිය යුතුය.

(4) යම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී සලකා බලනු ලබන යම් කරුණකට අදාළව ලබා දෙනු ලබන ඡන්ද සමාන වුවහොත් සභාපතිවරයාට තම මුල් ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ද තිබිය යුතුය.

(5) යම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු තෝරා පත් කර ගැනීමෙහිලා හෝ පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබුණ බවට හෝ එවැනි සාමාජියෙකු නුසුදුස්සකු වූ බවට පසුව සොයා ගනු ලැබුවහොත් එම තැනැත්තාට සුදුසුකම් තිබූ ලෙස සලකා එම රැස්වීමේදී කරන ලද සියලු ක්‍රියා වලංගු විය යුතුය.

(6) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක් යම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතුය.

නිලබලයෙන් පත්කල සාමාජිකයින්.

10. අධිකාරියට නිල බලයෙන් පත්වන සෑම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක්ම තමා අධිකාරියට පත් කරනු ලැබුවේ යම් ධුරයක් ප්‍රකාරවද එම ධුරය දරන තාක් කල් නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ධුරය දැරිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික නිල කාලය අවසන් වූ පසු නැවත පත් කළ හැකිය.

සාමාජිකයින්ට අදාළ විධිවිධාන.

11 (1) මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම යන හේතු මත යම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු කළින් ධුරය අත්හල හොත් මිස, අධිකාරියේ සෑම පත්කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක්ම අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර,යම් හේතුවක් මත ඉවත් කරනු ලැබුවහොත් මිස. නැවත පත් කිරීම සඳහා ඔහු හෝ ඇය සුදුස්සකු විය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් හේතු දක්වා යම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(3) යම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු විසින් අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවකදී ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එසේ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් භාර ගැනීමෙන් පසු බලාත්මක විය යුතුය.

(4) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික තනතුරක් පුරප්පාඩු වීමේදී එම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා පත් කිරීමට මෙම ප්‍රඥප්තියේ විධිවිධාන අමාත්‍යවරයා විසින් සැලකිල්ලට ගෙන ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එම අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයා තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතුය.

සාමාජිකයෙකු වීම සඳහා නුසුදුසුකම්.

12. යම් තැනැත්තෙකු -

(1) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු නම්,

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන්නේ නම්,

(3) පිළිගත් වෛද්‍ය මණ්ඩලයකින් සිහිවිකල් තැනැත්තෙකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ පූර්ණ අකර්මන්‍යතාවයකට පත්ව ඇත්නම්,

(4) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ බුන්වත්භාවයට පත් තැනැත්තෙකු වශයෙන් ප්‍රකාශ කරනු ලැබ, එම බුන්වත්භාවයෙන් නිදහස් කරනු නොලැබූ තැනැත්තකු නම්,

(5) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් අපරාධමය දණ්ඩනයකට යටත් කරනු ලැබ සිටියේ නම් හෝ එවැනි දණ්ඩනයක් විඳිමින් සිටින්නේ නම්,

(6) අල්ලස් සම්බන්ධ වරදකට චෝදනා ලැබ සිටින්නෙකු හෝ වරදකරුවෙකු නම් එම තැනැත්තා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස තවදුරටත් ක්‍රියා කිරීමට නුසුදුස්සකු විය යුතුය.

13 (1) පළාත් සභාවේ මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා විෂයභාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පාරිශ්‍රමිකයක් පමණක් අධිකාරියේ රැස්වීම්වලට පැමිණීම වෙනුවෙන් අධිකාරියේ සාමාජිකයින්ට ගෙවනු ලැබිය හැකිය. *අධිකාරියේ රැස්වීම්වලට පැමිණීම සඳහා පාරිශ්‍රමික.*

(2) මසකට එක්වරක් අධිකාරියේ අවශ්‍යතාවය මත අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය යුතු අතර, අවශ්‍ය වන්නේ නම් විෂයභාර අමාත්‍යවරයාට හෝ විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාට විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවිය හැකිය. *අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර.*

14 (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතුය. *මුද්‍රාව.*

(2) අධිකාරියේ මුද්‍රාව -

(අ) අධිකාරියේ සභාපතිවරයා භාරයේ තිබිය යුතුය.

(ආ) තමන් පැමිනි සිටි බවට සාධන පත්‍රයකට හෝ ලේඛණයකට අත්සන් තබන අධිකාරියේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට, ලේඛනයකට මුද්‍රාව නොතැබිය යුතුය.

11 වැනි කොටස

**අධිකාරිය සතු බලතල සහ කාර්යයන්**

15. අධිකාරියේ බලතල හා කාර්යයන් පහත සඳහන් පරිදි විය යුතුය. *බලතල හා කාර්යයන්.*

(1) (i) පළාත තුළ මගී අවශ්‍යතාවය සපුරාලීම, විධිමත් කිරීම හා භාණ්ඩ ප්‍රවාහන සේවා විධිමත් කිරීම සඳහා අධිකාරි පත්‍රයක් නිකුත් කිරීම, අළුත් කිරීම, සංශෝධනය කිරීම, අවලංගුකිරීම, කාලය දීර්ඝ කිරීම සහ අයිතිය පැවරීම. *මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා සම්බන්ධ බලතල.*

(ii) පළාත තුළ මගී හෝ භාණ්ඩ ප්‍රවාහන සේවා අවසරපත්‍ර ලාභියෙකු විසින් මගී ප්‍රවාහන සේවයේ හෝ භාණ්ඩ ප්‍රවාහන සේවයේ යොදවනු ලබන මෝටර් වාහනයක අවසරපත්‍රලාභියා විසින් පවත්වාගෙන යා යුතු ගුණාත්මකභාවය සහ යෝග්‍යතාවය පිළිබඳ වෙනත් නීතියක් මගින් නියම කර නොමැති මගී ප්‍රවාහනයට හා භාණ්ඩ ප්‍රවාහනයට අත්‍යවශ්‍ය වන ප්‍රමිති අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීම ; *මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා සඳහා යොදාගන්නා වාහනවල යෝග්‍යතාවය.*

(iii) මෙම ප්‍රඥප්තිය යටතේ යම් අරමුණක් සඳහා අවශ්‍ය වන්නා වූ තොරතුරු හා වාර්තා අධිකාරිය වෙත සපයන ලෙස මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලබා ඇති තැනැත්තෙකුට හෝ භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලබා ඇති තැනැත්තෙකුට නියම කිරීම ; *තොරතුරු සැපයීම.*

(iv) පළාත තුළ ගාස්තුවක් , ප්‍රතිලාභයක්, හෝ ත්‍යාගයක් සඳහා පාසල්, විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල සහ ඒ හා සමාන වෙනත් ආයතන වල ශිෂ්‍යයන් ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ අනුග්‍රාහක ගාස්තු මත ප්‍රවාහන සේවා සැලසීම හා රීති පැනවීම. *පාසල් ළමුන් ප්‍රවාහනය කිරීම.*

කාර්යාල සේවක හා කර්මාන්ත ශාලා සේවකයින් ප්‍රවාහනය කිරීම.

(v) පළාත තුළ ගාස්තුවක් , ප්‍රතිලාභයක් හෝ ත්‍යාගයක් සඳහා බස් රථවලින් හෝ වෑන් රථවලින් කරනු ලබන කාර්යාල සේවක හා කර්මාන්තශාලා සේවක ප්‍රවාහනය කිරීමේ සේවා විධිමත් කිරීම. එකී මගී ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම හා රීතී පැනවීම ;

ත්‍රිරෝද රථ හා කුලී රථ මගින් මගීන් ප්‍රවාහනය කිරීම.

(vi) පළාත තුළ ගාස්තුවක් අය කර හෝ ගාස්තුවක් අය නොකර ප්‍රතිලාභයක් මත ත්‍රීරෝද රථවලින් හෝ කුලී රථවලින් කරනු ලබන භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා විධිමත් කිරීම සඳහා එකී මගී ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම හා රීතී පැනවීම ;

අන්තර් පළාත් ප්‍රවාහන සේවා.

(vii) (අ) අධිකාරිය මගින් නිකුත් කරනු ලබන මගී හෝ භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍ර නොමැති වූ ද වෙනත් පළාතකින් මධ්‍යම පළාතට පිවිස මධ්‍යම පළාත තුළ හෝ මධ්‍යම පළාත හරහා ගාස්තුවක් ත්‍යාගයක් ප්‍රතිලාභයක් හෝ වෙන් වෙන් ගාස්තු මත මගී හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙන මෝටර් වාහනවලින් සේවා ගාස්තු අය කිරීම ;

(ආ) ජාතික ගමනා ගමන කොමිෂන් සභාව හෝ වෙනත් ආයතන විසින් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව නිර්දේශ ඉල්ලා සිටින අවස්ථාවකදී උචිත පරිදි නිර්දේශ ලබාදීම සහ මෙම අධිකාරියේ නිර්දේශයකින් තොරව නිකුත් කර ඇති අවසර පත්‍රයක් යටතේ ධාවනය වන බස්රථ සඳහා පිවිසුම් අවසරය ලබා නොදීම හා ඒ හා සම්බන්ධ නෛතික ක්‍රියා මාර්ග ගැනීම ;

නව ව්‍යාපෘති හඳුන්වා දීම.

(viii) මධ්‍යම පළාත තුළ මගී ප්‍රවාහන සේවාවේ වර්ධනය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම වෙනුවෙන් මගී ජනතාවට මෙන්ම ආයෝජකයින්ගේ සංවර්ධනය උදෙසා නව ව්‍යාපෘති හඳුන්වාදීම, ක්‍රියාවට නැංවීම සහ විෂයභාර අමාත්‍යවරයාගේ හා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය හා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මේ වෙනුවෙන් අනු කමිටු පිහිටුවීම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා පාලනය කිරීමට අදාළ රීති හා නියමයන් පැනවීමේ බලය අධිකාරියට ඇත.

කාල සටහන් නියම කිරීම.

(ix) පළාත ඇතුළත සියලු පොදු මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා බස්රථ ධාවනය සඳහා පොදු, ඒකාබද්ධ හෝ අධිකාරිය විසින් උචිත යැයි තීරණය කරනු ලබන විධිමත් කාලසටහන් නියම කිරීම, එම කාල සටහන් අනුව, ධාවන කටයුතු කළ යුතු බවට සියළු 'ධාවකයන්ට නියම කිරීම හා උල්ලංඝණය කරන්නන් සම්බන්ධයෙන් ස්ථානීය සේවා ගාස්තු නියම කිරීම හා නෛතික ක්‍රියාමාර්ග ගැනීම ;

අවසර පත්‍ර නිකුත් කිරීම.

(x) අවසර පත්‍ර සහ වෙනත් අධිකාරි පත්‍රයක් නිකුත් කිරීම, අලුත් කිරීම, සංශෝධනය කිරීම, අයිතිවාසිකම් පැවරීම ;

බස්රථ ගමනාන්ත නාම පුවරු ආදිය.

(xi) අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ අවසරපත්‍ර ලාභී බස්රථයක ඇතුළත සහ පිටත ප්‍රදර්ශනය කළ යුතු ගමනාරම්භ හා ගමනාන්ත නාම පුවරු සලකුණු හා සංකේත පවත්නා රාජ්‍ය ප්‍රතිපත්ති හා ප්‍රමිතීන්ට අනුව නියම කිරීම ;

රියදුරන් සහ කොන්දොස්තර වරුන් ලියාපදිංචි කිරීම.

(xii) අධිකාරිය විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් හෝ වෙනත් අධිකාරි පත්‍රයක් යටතේ මගී ප්‍රවාහනය හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙන මෝටර් වාහන වල රියදුරන් කොන්දොස්තරවරුන් සහ රිය සහයකයින් ලියාපදිංචි කිරීම, හැඳුනුම්පත් නිකුත් කිරීම සහ ලියාපදිංචි කරන ලද රියදුරන්, කොන්දොස්තරවරුන් සහ රිය සහයකයන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීම, අලුත් කිරීම, අත්හිටුවීම ;

හදිසි පරීක්‍ෂණ කණ්ඩායම් සහ භාණ්ඩ ප්‍රවාහනය.

(xiii) පළාත ඇතුළත මගී සහ භාණ්ඩ ප්‍රවාහනයට සම්බන්ධව මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන ක්‍රියාවන් සෙවීම, වැළැක්වීම සහ ඒවාට විරුද්ධව ක්‍රියා කිරීම අරමුණු කොට හදිසි පරීක්‍ෂණ කණ්ඩායම් ස්ථාපනය කිරීම හෝ ස්ථාපනය කරවීම හෝ එකී කණ්ඩායම්වල බලතල සහ කාර්යයන් නියම කිරීම ;

(xiv) කුලී මෝටර් රථ සහ භාණ්ඩ ප්‍රවාහනය කෙරෙන වාහන නැවතුම් පොලවල් පිහිටුවීම, නඩත්තු කිරීම, කළමනාකරණය, සංවර්ධනය කිරීම, වෙනස් කිරීම, වසා දැමීම සහ නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම, නැවතුම්පොල භූමියේ මායිම් තුළ ඇති හිස් ඉඩකඩ සහ ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීම ; — කුලී මෝටර් රථ සහ භාණ්ඩ ප්‍රවාහනය කරන රථ නැවතුම් ස්ථාන.

(xv) පළාත තුළ වෙන් වෙන් ගාස්තු මත මගී ප්‍රවාහන සේවාවන් පවත්වාගෙන යා හැකි මාර්ගයන් හඳුනා ගැනීම, වර්ග කිරීම සහ එකී එක් එක් මාර්ගයන් හි මගී ප්‍රවාහන සේවා කටයුතු සඳහා පාවිච්චි කළ යුතු බස්රථ සහ වෙනත් මෝටර් වාහන වර්ගය හා ප්‍රමිතිය නියම කිරීම ; — මගී ප්‍රවාහන සේවා මාර්ග හඳුනා ගැණීම හා ඒවායේ ධාවනය කළයුතු මෝටර් වාහන නියම කිරීම.

(xvi) අධිකාරියේ අරමුණු පරමාර්ථ සහ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සහ වෙනත් යම් නීතියක නියමයන්ට යටත්ව ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රීලංකාවෙන් පිටත යම් තැනැත්තෙකු හෝ ආයතනයක් සමග ගිවිසුම් සහ කොන්ත්‍රාත් වලට එළඹීම සහ එකී අරමුණු පරමාර්ථ සහ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වෙනත් ආයතන සමග සම්බන්ධ විම ; — ගිවිසුම් හා කොන්ත්‍රාත්.

(xvii) රියදුරන්, කොන්දොස්තරවරුන් සහ රිය සහයකයන් පුහුණු කිරීම සඳහා රියදුරු පුහුණු පාසැල් ආරම්භ කිරීම , පුහුණු පාඨමාලා පැවැත්වීම ; — රියදුරු, කොන්දොස්තර හා රිය සහයකයන් පුහුණු කිරීම.

(xviii) භාණ්ඩ හා මගී ප්‍රවාහන සේවා සඳහා යොදා ගන්නා මෝටර් රථ වාහන වල යෝග්‍යතාව පරීක්ෂා කිරීමේ ස්ථාන පවත්වා ගෙන යාම — මෝටර් රථ වාහන වල යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

(2) අධිකාරියට පළාත තුළ පිහිටි උපලේඛණ අංක 1 හි සඳහන් බස් රථගාල් හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන සම්බන්ධයෙන් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කළ හැක : — පළාතේ බස් නැවතුම්පලවල් පරිපාලනය.

(i) බස් රථගාල්, හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන පිහිටුවීම, නඩත්තු කිරීම, වසා දැමීම කළමනාකරණය, සංවර්ධනය කිරීම, වෙනස් කිරීම, නිත්‍යානුකූලව අත්පත් කර ගැනීම, නැවතුම්පොල භූමියේ මායිම් තුළ ඇති හිස් ඉඩකඩ සහ ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීම ;

(ii) බස් නැවතුම්පොලවල බස්රථ ධාවන කළමනාකරණ කටයුතු, කාල සටහන් නියම කිරීම සහ ක්‍රියාත්මක කරවීම හා ගමන් වාර ආරම්භක ස්ථාන නියම කිරීම මෙන්ම එකී කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය අධිකාරියේ කාර්ය මණ්ඩල යෙදවීම සහ ඔවුන්ගේ බලතල, කාර්යයන් හා වගකීම් නියම කිරීම සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම, බස් නැවතුම්පොල වල අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු වාර්තා සහ ලිපිලේඛණ හා ඒවායේ සටහන් කළ යුතු තොරතුරු නියම කිරීම ;

(iii) අධිකාරිය විසින් පරිපාලනය හා කළමනාකරණය කරගෙන යනු ලබන බස් නැවතුම්පලවල පරිපාලනය හා ප්‍රවාහන සේවා කටයුතුවලට බාහිර පාර්ශ්වයන් සම්බන්ධ කරගැනීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ නිර්ණායක තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වන්නේය.

(3) විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව අධිකාරියේ කාර්යන් සඳහා යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්පත් කරගැනීම, බැහැර කිරීම බද්දට හෝ කුලියට දීම/ගැනීම ; — දේපල අත්පත් කරගැනීම/බැහැර කිරිම.

(4) මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සහ කරවීම සඳහා අවශ්‍ය යැයි අධිකාරියට හැඟෙන වෙනත් බලතල ක්‍රියාත්මක කිරීම ;

111 වැනි කොටස

**අධිකාරියේ කාර්ය මණ්ඩලය**

16. අධිකාරියේ කටයුතු කර ගෙන යාම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කිරීම සහ අධිකාරියට අදාළ වන සේ වෙනම ආයතන සංග්‍රහයක් , බඳවා ගැනීමේ පරිපාටිය සහ මුදල් රෙගුලාසි අනුමත කර ගන්නා තෙක් අධිකාරියේ සියලු ආයතන හා මුදල් පරිපාලන කටයුතු සඳහා රාජ්‍ය සේවයට පොදුවේ බලපානු ලබන ආයතන සංග්‍රහය හා මධ්‍යම පළාත් මුල්‍ය රීති සංග්‍රහයට අනුකූලවද, තත් කාලයේ බල පැවැත්වෙන නීතිරීති, රෙගුලාසි හා චක්‍රලේඛවලට අනුකූලවද, මතු දැක්වෙන කාර්යයන් කිරීමට අධිකාරියට බලය ඇත. — කාර්ය මණ්ඩලය.

(1) මධ්‍යම පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව සියලු පත්කිරීම්, උසස් කිරීම්, කාර්ය මණ්ඩලයට අදාළ වන අධ්‍යාපනික, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් සහ වේතන හා වැටුප් ප්‍රමාණයන්ද ඇතුලුව බඳවා ගැනීමේ පටිපාටිය සැකසීම හා අදාළ ආයතන වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම ;

(2) විනය පරීක්ෂණ පැවැත්වීම, දඩුවම් නියම කිරීම හා සේවය අවසන් කිරීම සහ අහෝසි කිරීම ද ඇතුළු විනය පාලනය, සාමාන්‍ය හැසිරීම, නිවාඩු යනාදි පිරිස් පාලනයට අදාළ නියමයන් පැනවීම ;

(3) කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමභාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රම ඇති කිරීම හා ඒ සඳහා දායකවීම ;

(4) අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල ක්‍රියාත්මක කිරීම, පාරිතෝෂික දීමනා ගෙවීම සහ අධිකාරිය තීරණය කරන පරිදි විධිමත් අනුමැතියකට යටත්ව විශේෂ දීමනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ;

(5) අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා සුභ සාධන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම ;

(6) සාමාන්‍යාධිකාරි ඇතුළු සියළුම මාණ්ඩලික නිළධාරින් ඔවුන් විසින් ඉටු කරන ලද රාජකාරි පිළිබඳව කාර්ය සාධන සමාලෝචනයක් සෑම වසර 02 කට වරක් සිදු කිරීමට සහ එමගින් ලැබෙන ප්‍රතිඵලය පදනම් කරගෙන එකී නිළධාරියාගේ ඉදිරි කාලය පිළිබඳ තීරණය කිරීම.

*විනය ක්‍රියා මාර්ග සඳහා අභියාචනා කිරීම.*

17. අධිකාරිය විසින් පනවන ලද විනය නියෝගයකට එරෙහි වන යම් සේවකයකු දින දහහතරක් තුළ විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් කළ හැකි අතර, ලේකම්වරයා විසින් ඒ සඳහා කමිටුවක් පත්කර තීරණයක් ලබා දිය යුතුය. ලේකම්වරයාගේ තීරණය අවසානාත්මකය.

*සේවකයින් බඳවා ගැනීම හා අන්තර්ග්‍රහණය.*

18. (1) ඉහත16 ඡේදය යටතේ පනවා ඇති විධිවිධාන ප්‍රකාරව සේවකයින් බඳවා ගැනීමට අධිකාරියට බලය ඇත.

(2) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිළධාරින්, සේවකයින්, අදාළ බලධාරින්ගේ අනුමැතිය ඇතිව ද්විතීයන හෝ කොන්ත්‍රාත් පදනම් මත සේවයට බඳවා ගැනීම සඳහා අධිකාරියට බලය ඇත්තේය.

(3) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු යම් නිළධාරියෙකු හෝ සේවකයෙකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ද්විතීයන පදනම මත බඳවා ගනු ලබන අවස්ථාවක, තත් කාලයේ බල පැවැත්වෙන රාජ්‍ය කළමනාකරණ නීති හා රෙගුලාසිවලට අනුකුලව කටයුතු කළ යුතුය.

*අධිකාරියේ සේවා නියුක්තිකයන් රජයේ සේවකයන් ලෙස සැලකීම.*

19. අධිකාරියේ සියළුම සාමාජිකයින්, නිලධරයින් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකුලව හා එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

*අල්ලස් පනතේ උපලේඛනගත ආයතනයකි.*

20. අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකුලව උප ලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතුය.

*සාමාන්‍යාධිකාරිවරයා.*

21. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසුකම් සපුරා ඇති අයෙකු විධිමත් පරිදි අධිකාරියේ සාමාන්‍යාධිකාරි ලෙස පත්කරනු ලැබිය යුතුය.

22. (1) අධිකාරියේ පොදු ප්‍රතිපත්තිමය විධානයන්ට යටත්ව, අධිකාරියේ එදිනෙදා කටයුතු මෙහෙයවීමද, අධිකාරියේ සේවා නියුක්තියන් පිළිබඳ සාමාන්‍ය විනය පාලනය ඇතුළුව පරිපාලනමය කාර්යයන්ද අධිකාරියේ මූල්‍ය පාලනය පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණයද, වෙනුවෙන් වගකීම සාමාන්‍යාධිකාරිවරයාට පැවරෙන්නේය.

(2) සභාපතිවරයාවරයා විසින් අධිකාරියේ අභිවෘද්ධිය සඳහා කලින්කළ අවශ්‍ය යැයි සැලකෙන වෙනත් බලතල හා කාර්යයන් සාමාන්‍යාධිකාරිවරයා වෙත පවරා දෙනු ලැබිය හැකිය.

23 (1) අධිකාරියේ අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා නිලධාරීන් යෙදවීම, මෙහෙයවීම, අධීක්‍ෂණය, පාලනය කිරීම හා විනය කටයුතු පවත්වා ගෙන යාම. සාමාන්‍යාධිකාරි වරයාගේ බලතල හා කාර්යයන්.

(2) අනාගත ප්‍රවාහන අවශ්‍යතාවයන් හඳුනාගෙන ප්‍රවාහන ක්‍ෂේත්‍රයේ සංවර්ධනය සඳහා නව නිර්මාණාත්මක ක්‍ෂේත්‍රයන් හඳුනා ගැනීමත්, ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූල යෝජනා ඉදිරිපත් කිරීමත් ඒ සඳහා අදාළ නීති පිළිවෙත් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

(3) අධිකාරියේ වත්කම් ආරක්‍ෂා කිරීම අධිකාරිය විසින් එළඹි ගිවිසුම් කටයුතු පවත්වාගෙන යාම.

24. සාමාන්‍යාධිකාරිට පැවරී ඇති බලතල හා කර්තව්‍යයන් අතුරින් ඔහු අවශ්‍ය යැයි සලකන පරිදි යම් කිසිවක් වෙනත් සුදුසු මාණ්ඩලික නිලධාරීන් වෙත ලිඛිතව පැවරිය හැකිය. සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පැවරීම.

IV වැනි කොටස

**මගී ප්‍රවාහන සහ භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍ර**

25. (1) කිසියම් තැනැත්තෙකු විසින් නියමිත දින හෝ ඉන් පසුව මධ්‍යම පළාත තුළ අධිකාරිය විසින් නිකුත් කරන ලද සහ තත්කාලයේ බල පවත්නා වලංගු නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක හෝ ඒ හා සමාන වෙනත් අධිකාරි පත්‍රයක් යටතේ හැර යම් ගාස්තුවක් හෝ ත්‍යාගයක් හෝ වෙන් වෙන් වශයෙන් ගාස්තු අයකර මගීන් ප්‍රවාහනය කිරීම සඳහා කිසිම තැනැත්තෙකු විසින් මෝටර් වාහනයක් භාවිතා නොකළ යුතුය. නිත්‍ය සේවා සහ විශේෂ සේවා සඳහා මගී ප්‍රවාහන සේවා අවසර පත්‍ර.

(2) ඉහත (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රතිපාදන උල්ලංඝණය කරමින් පළාත තුළ මගී ප්‍රවාහනය කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේය.

(3) කිසිම තැනැත්තෙකු හෝ ආයතනයක් විසින් මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන් පසුව වෙන් වෙන් ගාස්තු මත මාර්ගස්ථ මගී ප්‍රවාහන නිතිපතා සේවය සඳහා බස්රථයක් හෝ පළාත් අධිකාරිය විසින් මගී ප්‍රවාහනය සඳහා අනුමත කර ඇති වාහන හැර වෙනත් මෝටර් වාහන යොදා නොගත යුතුය.

26. මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසුව අධිකාරිය විසින් නිකුත් කරන ලද සහ තත් කාලයේ බල පවත්නා වලංගු භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් හෝ වෙනත් අධිකාරි බලපත්‍රයක් යටතේ හැර ගාස්තුවක් හෝ ත්‍යාගයක් හෝ සඳහා මධ්‍යම පළාත ඇතුළත භාණ්ඩ ප්‍රවාහනය සඳහා මෝටර් වාහනයක් පාවිච්චි නොකළ යුතුය. භාණ්ඩ ප්‍රවාහන සේවා සඳහා නිතිපතා අවසර පත්‍ර.

27. නියමිත දිනට හා ඉන් පසුව ඒ සඳහා අධිකාරියෙන් ලබා ගත් තත් කාලයේ බල පවත්නා විශේෂ අවසර පත්‍රයක් හෝ එවැනි අධිකාරි බලපත්‍ර මත හැර වෙන් වෙන් ගාස්තු මත නිත්‍ය මගී ප්‍රවාහන සේවය සඳහා යොදා ගෙන ඇති යම් බස්රථයක් එකී නිත්‍ය සේවාවෙන් බැහැරව වෙනත් මගී ප්‍රවාහන සේවාවක් සඳහා පළාත තුළ හෝ පළාත් අතර යොදා නොගත යුතුවේ. විශේෂ අවසර පත්‍ර.

28. (1) නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් මගින් එහි අඩංගු කොන්දේසිවලට අනුකූලව ඒ අවසර පත්‍රයේ සඳහන් මාර්ගයේ හෝ මාර්ගවල මගීන් ප්‍රවාහනය සඳහා එකඟ වූ සේවාව පවත්වා ගෙන යාම සඳහා මෝටර් වාහනයක් යොදා ගැනීමට ඒ අවසර පත්‍රය දරන තැනැත්තාට අයිතිවාසිකම් ලැබෙන්නේය. මගීන් ප්‍රවාහනය කිරීම සඳහා නිත්‍ය සේවා අවසර පත්‍ර.

(2) කිසියම් බස්රථයක් වෙනුවෙන් එකී ලියාපදිංචි අයිතිකරු නොවන තැනැත්තෙකුට නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතුය.

(3) මෙම ප්‍රඥප්තියේ 25(3) උපවගන්තිය යටතේ දක්වා ඇති අධිකාරිය විසින් නිකුත්කරන ලද නිත්‍ය මගී ප්‍රවාහන අවසර පත්‍රයක් ලබා ඇති බස්රථ නොවන වෙනත් මෝටර් වාහනවලට ද 28 වගන්තියේ ඉහත උප වගන්තිවල දක්වා ඇති විධිවිධාන එකසේ බල පවත්වන්නේය.

මෙම වගන්තියේ "මෝටර් වාහනයක්" යන්නෙන් මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන මෝටර් වාහන අදහස් වේ.

භාණ්ඩ ප්‍රවාහන සඳහා නිත්‍ය සේවා අවසර පත්‍ර.

29. (1) නිත්‍ය භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් මගින් එහි අඩංගු කොන්දේසිවලට අනුකූලව පළාත තුළ භාණ්ඩ ප්‍රවාහනය සඳහා එකඟ වූ සේවය පවත්වා ගෙන යාම සඳහා මෝටර් වාහනයක් යොදා ගැනීමට ඒ අවසර පත්‍රය දරන්නා වූ තැනැත්තාට අයිතිවාසිකම ලැබෙන්නේය.

(2) නිත්‍ය භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙන කිසියම් මෝටර් වාහනයක් වෙනුවෙන් එකී ලියාපදිංචි අයිතිකරු නොවන තැනැත්තෙකුට නිත්‍ය භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතුය.

මෙම වගන්තියේ, "මෝටර් වාහනයක්" යන්නෙන් භාණ්ඩ ප්‍රවාහන සේවාවේ යෙදෙන ලොරි, ට්‍රේලර් වැනි මෝටර් වාහන අදහස් වේ.

මගී හෝ භාණ්ඩ නිත්‍ය ප්‍රවාහන සේවා සඳහා ඉල්ලුම් කිරීම.

30. අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම ඉල්ලුම්කරුවෙක්ම නියමිත ආකෘතියට අනුව මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරුගේ අත්සන යටතේ පහත සඳහන් විස්තරද සමග සිය අයදුම්පත්‍රය අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(1) ඉල්ලුම් පත්‍රය අදාළ වන්නේ බස් රථයක් සඳහා නම් -

(i) එහි ලියාපදිංචි අංකය, ආසන සංඛ්‍යාව හා අභ්‍යන්තර උස ප්‍රමාණය ;

(ii) වෙන් වෙන් ගාස්තු මත මගී ප්‍රවාහන සේවා සඳහා ඉල්ලුම් පත්‍රයට අදාළ බස්රථය යොදා ගැනීමට අදහස් කරනු ලබන මාර්ගයේ ආරම්භක ස්ථානය, අතරමග වැදගත් නැවතුම්පොලවල්, ගමනාන්තය, මාර්ග අංකය හා මාර්ගයේ දුර ප්‍රමාණය (දළ වශයෙන්) සඳහන් කළ යුතුය ;

(iii) මෙම ප්‍රඥප්තිය යටතේ දක්වා ඇති පරිදි අවසර පත්‍රය ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථ සඳහා අධිකාරිය ඉල්ලා සිටින වෙනත් විස්තර ඉල්ලුම්කරු විසින් සැපයිය යුතුය.

(2) ඉල්ලුම් පත්‍රය අදාළ වන්නේ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා මෝටර් වාහනයක් යොදා ගැනීම සඳහා නම් -

(i) එකී ලියාපදිංචි අංකය, තාරබර, පැටවිය හැකි උපරිම බර ප්‍රමාණය ;

(ii) භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන වාහනයේ මෝටර් වාහනයට ට්‍රේලරයක් ඈඳා ඇත්නම් එකී ට්‍රේලරයේ ලියාපදිංචි අංකය, තාරබර, පැටවිය හැකි උපරිම බර ප්‍රමාණය ;

(iii) මෙම ප්‍රඥප්තිය යටතේ දක්වා ඇති පරිදි අවසර පත්‍රය ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථ සඳහා අධිකාරිය ඉල්ලා සිටින වෙනත් විස්තර අදාළ ඉල්ලුම්කරු විසින් සැපයිය යුතුවේ.

බලපත්‍ර සම්බන්ධයෙන් අභිමතය.

31. අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ද ප්‍රදානය කරන ලද අවසර පත්‍රයක් අලුත් කිරීම, සංශෝධනය කිරීම, එහි අයිතිවාසිකම් පැවරීමට අවසර දීම හෝ එකී ක්‍රියාවන් ප්‍රතික්ෂේප කිරීමේ බලය අධිකාරිය සතු වේ.

අවසර පත්‍ර වලංගු වන කාල සීමාව.

32. නියම කරනු ලබන ගාස්තුව හෝ ගාස්තු ගෙවනු ලබන්නේ නම් හා මෙම ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලබන හෝ පනවනු ලබන කොන්දේසි හා අවශ්‍යතා සපුරාලන්නේ නම් මිස අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ අවසර පත්‍රයක් කිසිම පුද්ගලයකුට නිකුත් නොකළ යුතුය.

මගී ප්‍රවාහන අවසර පත්‍රයක අඩංගු කළයුතු කොන්දේසි.

33. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධානවලට යටත්ව මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයකම මහජනතාවගේ ආරක්ෂාව, යහපත හා පහසුව සැලසීම තහවුරු වන පරිදි කොන්දේසි හා ප්‍රමිතීන් පැනවිය යුතු අතර, එය අවස්ථානුකූලව සංශෝධනය කළ හැකිය.

34. ප්‍රඥප්තියේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවලට යටත්ව මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍රයකම මහජනතාවගේ ආරක්ෂාව, යහපත, පහසුව හා භාණ්ඩවල ආරක්ෂාව සැලසීම පිණිස අධිකාරිය විසින් තීරණය කරනු ලබන කොන්දේසි හා ප්‍රමිතීන් පැනවිය හැකි අතර, එය අවස්ථානුකූලව සංශෝධනය කළ හැකිය. භාණ්ඩ ප්‍රවාහන බලපත්‍රයක අඩංගු කළ යුතු කොන්දේසි.

35. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලැබූ මගී හෝ භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් වෙනත් යම් පාර්ශවයක් වෙත පැවරීමට අදාළ නියෝග ඇමතිවරයා මගින් පැනවිය යුතුය. අවසර පත්‍රයක් පැවරීම.

36. අවසර පත්‍රයක් දරන්නෙකු විසින් එය අළුත් කිරීම සඳහා අධිකාරිය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවකදී ඒ අවසර පත්‍රය දරන්නා , අවසර පත්‍රයක් අළුත් කිරීම.

(1) මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග අනුව ක්‍රියාකර ඇති බවටත්,

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයන්ට අදාළව යම් වරදකට වරදකරු වී නොමැති බවට අධිකාරිය සෑහීමකට පත්වන්නේ නම්, ඔහු විසින් ඒ අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වන දින සිට ඉදිරියට එක් අවුරුද්දක් හෝ අධිකාරිය විසින් තීරණය කරනු ලබන අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා ඒ අවසර පත්‍රය අළුත් කරනු ලැබිය හැකිය.

37. අවසර පත්‍රයක් දරන්නෙකු, අවසර පත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

(1) මේ ප්‍රඥප්තියේ විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ උල්ලංඝණය කර ඇති විට,

(2) අවසර පත්‍රය සඳහා අධිකාරිය වෙත ඉල්ලුම් කරන ලද ඉල්ලුම් පත්‍රයක හෝ මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරිය වෙත ඉදිරිපත් කළයුතු වන්නා වූ යම් වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරු වල හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමකදී ඔහු ව්‍යාජ හෝ වැරදි විස්තර සපයා ඇති බවට අධිකාරිය වෙත අනාවරණය වුවහොත් අධිකාරිය විසින් ඒ අවසර පත්‍රය සම්බන්ධයෙන් නියමිත අවසර පත්‍ර ගාස්තුව මෙන් තුන් ගුණයකට නොවැඩි අධිභාරයක් ගැනීමේ නියෝගයක් හෝ අවසර පත්‍රය තුන් මසකට නොවැඩි කාල සීමාවකට අත්හිටුවීමේ නියෝගයක් හෝ අවසර පත්‍රය අවලංගු කිරීමේ නියෝගයක් හෝ පැනවිය හැකිය,

(3) මෙම වගන්තිය යටතේ අධිකාරිය විසින් අවසර පත්‍රයක් අත්හිටුවීමක් හෝ අවලංගු කිරීමක් හෝ කළ වහාම අවසර පත්‍ර දරන්නා අවසර පත්‍රයේ සඳහන් ප්‍රවාහන සේවාව පවත්වාගෙන යාම වහාම නතර කළ යුතුය.

38. අධිකාරිය විසින්, අධිකාරියේ තීරණයට හේතු අවසර පත්‍ර ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු බව.

(1) අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අළුත් කිරීම හෝ පැවරීම ප්‍රතික්ෂේප කිරීම හෝ,

(2) අවසර පත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ සංශෝධනය කිරීම හෝ අධිභාරයක් පැනවීම, හෝ ඒ පිළිබඳව තීරණයක් හෝ නියෝගයක් කරනු ලබන අවස්ථාවක, එකී තීරණයට හෝ නියෝගයට අවස්ථාවෝචිත පරිදි අවසර පත්‍ර ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍ර දරන්නාට දැනුම් දිය යුතුය,

(3) (1) හා (2) උපවගන්තිවල කාර්යයන් සඳහා නියෝගය හෝ තීරණය ලියාපදිංචි තැපෑලෙන් යැවූ දිනය එකී නියෝගය හෝ තීරණය කරන ලද දිනය ලෙස සැලකිය යුතු ය. එසේ වුව ද මෙම තීරණය ක්‍රියාත්මක වන දිනය ලියාපදිංචි තැපෑලෙන් යැවූ දිනයේ සිට දින තුනක් ගතවීමෙන් පසු එළඹෙන දිනය ලෙස සැලකිය යුතු ය.

(4) (1) හා (2) උපවගන්තිවල සඳහන් තීරණයකින් හෝ නියෝගයකින් අතෘප්තියට පත් අවසර පත්‍ර ඉල්ලුම්කරුවකු හෝ අවසරපත්‍රලාභියකු අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි එම තීරණය හෝ නියෝග තමාට ලැබුණු දිනයේ සිට දින දහ හතරක් ඇතුළත එම තීරණයට හෝ නියෝගයට විරුද්ධව ලිඛිත අභියාචනයක් පළාත් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. අභියාචනා.

(5) ඉහත 4 වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කොට ඇති අභියාචනය සලකා බැලීමෙන් පසු ලේකම්වරයා විසින්,

(i) අභියාචනයට ඉඩ දී අභියාචනය අදාළ අවසර පත්‍රය ප්‍රදානය කිරීමට හෝ අළුත් කිරීමට අධිකාරියට විධානය කිරීමට හෝ,

(ii) අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට හෝ,

(iii) අවසර පත්‍රය සංශෝධන කිරීමට හෝ තම තීරණයට අනුකූලවන පරිද්දෙන් එකී අවසර පත්‍රය ප්‍රදානය කරන මෙන් හෝ විධානය කළ හැකිය.

(6) ලේකම්වරයාගේ එකී තීරණය එකී අභියාචනය ලැබීමෙන් දින දහ හතරක් ඇතුළත අභියාචකයාට හා අධිකාරියට දැන්විය යුතු ය.

(7) හතරවන උපවගන්තියේ සඳහන් තීරණයකින් හෝ නියෝගයකින් අතෘප්තියකට පත් අවසර පත්‍ර ඉල්ලුම්කරුවකු හෝ අවසරපත්‍රලාභියකු අවස්ථාවෝචිත පරිදි එම තීරණය හෝ නියෝගය තමාට ලැබුණු දිනයේ සිට දින දහ හතරක් ඇතුළත එම තීරණයට හෝ නියෝගයට විරුද්ධව ලිඛිත අභියාචනයක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

(8) තමා වෙත ඉදිරිපත් කොට ඇති අභියාචනය සලකා බැලීමෙන් පසු අමාත්‍යවරයා විසින්,

(i) අභියාචනයට ඉඩ දි අභියාචනයට අදාළ අවසර පත්‍රය ප්‍රදානය කිරීමට හෝ අළුත් කිරීමට අධිකාරියට විධානය කිරීමට හෝ,

(ii) අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට හෝ,

(iii) අවසර පත්‍රය සංශෝධනය කිරීමට හෝ තම තීරණයට අනුකූලවන පරිද්දෙන් එකී අවසර පත්‍රය ප්‍රදානය කරන මෙන් හෝ විධානය කළ හැකිය.

(9) අභියාචනය මත අමාත්‍යවරයා විසින් ගනු ලබන තීරණය අප්‍රමාදව ලේකම්වරයාට, අධිකාරියට සහ අභියාචකයාට දැනුම් දිය යුතුය.

39. නියමිත දිනයේ දී හෝ ඉන් පසුව අධිකාරිය විසින් නිකුත් කරන ලද්දා වූ ද තත්කාලයේ වලංගුව පවතින්නා වූ ද වලංගු අවසර පත්‍රයක හෝ අධිකාරිය පිළිගනු ලබන වෙනත් අවසරයකින් තොරව කිසිදු මෝටර් වාහනයකට පළාත තුළ පිහිටි මඟී පර්යන්තයකට හෝ බස් නැවතුම්පලකට පිවිසීම නොකළ යුතුය.

## V වැනි කොටස

## මුදල්

අධිකාරියේ ගිණුම්.

40. (1) අධිකාරියට ඊටම අයත් ගිණුමක් තිබිය යුතු ය.

(2) පහත දැක්වෙන මුදල් අධිකාරියේ ගිණුමට බැර කරනු ලැබිය යුතු යඃ

(i) පළාත් සභාව හෝ මධ්‍යම රජය විසින් වෙන් කර දෙනු ලබන සියලු මුදල්,

(ii) ආධාර, පරිත්‍යාග ප්‍රදාන හා ණය වශයෙන් අධිකාරියට ලැබෙන මුදල්,

(iii) විවිධ ව්‍යාපෘති වෙනුවෙන් ලැබෙන මුදල්,

(iv) පළාත් අධිකාරියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ස්ථානිය සේවා ගාස්තු වශයෙන් අධිකාරියට ලැබෙන මුදල් හෝ ගාස්තු වශයෙන් අයකරනු ලබන සියලු මුදල් ,

(v) අධිකාරිය විසින් සිය බලතල ක්‍රියාත්මක කිරිම කාර්යන් හා කර්තව්‍යයන් ඉටු කිරීම මගින් ලබන හෝ අයකරනු ලබන සියලු මුදල්,

(3) ගිණුම් පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට හා පළාත් සභා අරමුදල සම්බන්ධයෙන් වන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ iii වන පරිච්ඡේදයේ විධිවිධානවලට යටත් විය යුතු ය.

41. අධිකාරියේ ගිණුමට ලැබෙන මුදල් ද ගෙවීම් පිළිබඳව ද සාමාන්‍ය අධීක්ෂණය පිළිබඳ වගකීම සාමාන්‍යාධිකාරිවරයාට පැවරෙන්නේය. ලැබීම් හා ගෙවීම් පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය.

42. අධිකාරියේ ගිණුම පහත සඳහන් පරිදි මුදල් වැයකළ හැකි වන්නේය: අධිකාරිය විසින් අරමුදල් උපයෝගී කර ගැනීම.

(1) අධිකාරියේ සාමාජිකයින්ගේ දීමනා,

(2) අධිකාරියේ නිළධාරින්, සේවකයින්ගේ වේතන, පාරිශ්‍රමික හා විධිමත් අනුමැතිය යටතේ අනෙකුත් දීමනා,

(3) 15 (viii) ප්‍රකාරව විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් අරමුදල් යෙදවීම,

(4) ව්‍යවසාය සංවර්ධන කටයුතු සඳහා අරමුදල් යෙදවීම,

(5) යටිතල පහසුකම් සංවර්ධනය කීරීම,

(6) අධිකාරියේ මුල්‍ය තතත්වය සැලකිල්ලට ගෙන සිදු කරනු ලබන මානව සම්පත් සංවර්ධන කටයුතු,

(7) මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරිය සතු බලතල, කාර්යයන් හා වගකීම් ඉටු කිරීමට අවශ්‍ය වන අධිකාරිය මගින් තීරණය කරනු ලබන වෙනත් ක්‍රියාකාරකම් සඳහා.

43. (1) අධිකාරියේ නිශ්චිත පරමාර්ථ සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය මත ණය ලබා ගැනීමට අධිකාරියට බලය ඇති අතර, ණය මුදල් ප්‍රමාණය ආපසු ගෙවීමේ කාල සීමාව, ණය පාලනය යන කොන්දේසි සහ ණය ලබා ගැනීමට අපේක්ෂිත ආයතන පළාත් අමාත්‍ය මණ්ඩලය තීරණය කරන පරිදි විය යුතු ය. අධිකාරිය විසින් ණය ගැනීම.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියට සිය වගකීම් ඉටු කීරීම සඳහා අවශ්‍ය වන කෙටිකාලීන මුදල් අවශ්‍යතා විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය මත, අමාත්‍යවරයාගේ අවසරය ඇතිව ; හා නියමයන්ට අනුකූලව අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකාරිය විසින් තාවකාලිකව ණයට ගත හැකිය.

එසේ වුව ද අධිකාරිය විසින් මේ වගන්තිය යටතේ ලබාගන්නා ලද තාවකාලික ණය මුදල් කිසිම අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මුදල් ප්‍රමාණයන් නොඉක්මවිය යුතුය.

44. අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය. මුදල් වර්ෂය.

45. (1) අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ සියලු මුල්‍යමය ගනුදෙනු හා සම්බන්ධයෙන් රජයේ විගණන දෙපාර්තමේන්තුව විසින් කලින් කළ විගණනය කරනු ලැබිය හැකිය. මධ්‍යම පළාතේ විගණන අධ්‍යක්ෂවරයාට ද අවශ්‍ය වූ විට විගණනය කළ හැකිය. අධිකාරියේ ගිණුම් විගණනය.

(2) එක් එක් මුදල් වර්ෂය සඳහා ගිණුමේ වත්කම් හා බැරකම් එම මුදල් වර්ෂය අවසන්ව මාස තුනක් ඉකුත්වීමට පෙර විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු ය. විගණනයේදී ඔහුට සහාය වීමේ කාර්යය සඳහා සුදුසුකම්ලත් යම් විගණකයෙකු හෝ විගණකයින්ගේ සේවාව ලබාගත හැකි අතර, ඔවුන් ඔහුගේ උපදෙස් හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) ගිණුම් විගණනය කිරීමේ කාර්යය සඳහා විගණකාධිපති විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා සභාපති/සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ලබන හෝ විගණන අංශය මගින් ඉල්ලුම් කරනු ලබන යම් මුදලක් විගණකාධිපති වෙත අධිකාරියේ අරමුදල්වලින් ගෙවිය හැකිවේ.

(4) විගණකාධිපතිවරයාට සහ ගිණුම් විගණනය කිරීමේදී ඔහුට සහාය වන යම් පුද්ගලයකුට විගණකාධිපතිවරයාට විගණන කාර්යයේ දී අවශ්‍ය යැයි සලකන සියලු පොත්පත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර් සහ ගිණුමට සම්බන්ධතාවයක් ඇති අනිකුත් ලියවිලි පරීක්ෂා කිරීමේ අවසරය තිබිය යුතු අතර, එම කාර්ය සඳහා අවශ්‍ය යැයි තමන්ගේ දැනුම අනුව සැපයිය හැකි තොරතුරු අධිකාරිය හෝ එහි නිලධාරින් විසින් ඔවුනට සැපයිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යයන් සඳහා, සුදුසුකම් ලත් විගණක, යනු -

(i) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ නැතහොත් ඒ හා සමාන නීතියෙන් පිළිගෙන ඇති කිසියම් ආයතනයක සාමාජිකයෙකුවන එම ආයතනය පාලක සභාව විසින් ගණකාධිකාරිවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා නිකුත් කර ඇති සහතිකයක් ලබාගෙන ඇති පුද්ගලයෙකු ;

(ii) එක් එක් වාසික හවුල්කරුවාට, ගණකාධිකාරිවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා එම ආයතනයේ කවුන්සලය මගින් නිකුත් කරන ලද සහතිකයක් සමග ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද ඒ හා සමාන වෙනත් ආයතනයක සාමාජිකත්වය දරන හවුල්කරුවන්ගෙන් සමන්විත විගණන සමාගමක් අදහස් වේ.

විගණකාධිපතිගේ වාර්තා.

46 (1) විගණකාධිපතිවරයා අධිකාරියේ ගිණුම් පරීක්ෂා කොට -

(i) ඔහුට අවශ්‍ය වූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ලැබුණ හෝ නොලැබුණු බව සඳහන් කරමින්,

(ii) අධිකාරියේ කටයුතු සත්‍ය හා සාධාරණ ලෙස පෙන්නුම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ගිණුම් වාර්තා මැනවින් පිළියෙල කර තිබේද යන්න සඳහන් කරමින්,

(iii) ඔහුගේ මතය අනුව පළාත් සභාව විසින් අධිකාරියේ ගිණුම් හා කටයුතු පිළිබඳව කිසියම් පරීක්ෂණයක් කිරීම සඳහා උනන්දුවක් දැක්විය යුතු යයි අදහස් කරන ගිණුම්වලට අදාළ කිසියම් කරුණක් වේ නම්, ඒ ගැන අවධානය යොමු කරමින් වාර්තාවක් ඉදිරිපත් කළ හැකිය.

(2) විගණකාධිපතිවරයා සිය වාර්තාව විගණනය කරන ලද ගිණුම් සමග අමාත්‍යාංශයේ ලේකම්වරයාට එවනු ඇත.

ගිණුම් වාර්තා හා අධිකාරියේ වාර්ෂික වාර්තාව අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීම.

47. එක් එක් වර්ෂයේදී ගිණුමේ වත්කම් හා බැරකම් පිළිබඳ විගණනය කළ ගිණුම් සහ විගණකාධිපති වාර්තාව තමා වෙත ලැබීමෙන් පසුව, ලේකම්වරයා විසින් එම වාර්තාවද, වත්කම් හා බැරකම් පිළිබඳ විගණනය කළ ගිණුම් ද අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශය ද සමග ප්‍රවාහන විෂයභාරව සිටින අමාත්‍යවරයා වෙත භාර කළ යුතු වන අතර, ඔහු විසින් ඒවායේ පිටපත් ඒවා අදාළ ගිණුමේ මුදල් වර්ෂය අවසන් වී මාස හතරක් ඇතුළත පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු වන්නේය.

## VI වැනි කොටස

### සාමාන්‍ය විධිවිධාන

විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

48. (1) අධිකාරිය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අධිකාරියට කලින් කලට පොදු හෝ විශේෂ විධිවිධාන නිකුත් කරනු ලැබිය හැකි වන අතර, අධිකාරිය ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(2) අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් තමා විසින් නියම කරනු ලබන ආකෘතියකින් තමා වෙත වාර වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කලට අධිකාරියට විධාන කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ සෑම විධානයක්ම ඉටු කළ යුතුය.

49. අධිකාරිය විසින් බලය දෙන හා වෙනත් කිසියම් අධිකාරි බලයක් ඇති යම් තැනැත්තෙකු විසින් කවර හෝ වේලාවක මධ්‍යම පළාත ඇතුළත කවර හෝ ස්ථානයකදී, වාහනයට ඇතුළුවීම සහ සෝදිසි කිරීම.

(1) භාණ්ඩ හෝ මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන යම් මෝටර් වාහනයක්, ඒ සඳහා වන බලය මෙම ප්‍රඥප්තිය හෝ වෙනත් ආයතනයකින් ලබා ඇත්ද යන වග, එම අවසර පත්‍රයට අදාළ කොන්දේසි එකී වාහනයේ රියැදුරු, කොන්දොස්තර, රිය සහයක හෝ භාරව සිටින තැනැත්තා පිළිබඳ ඇත්ද යන්න, ප්‍රඥප්තියේ විධාන හෝ රෙගුලාසි පිළිපැද ඇත්ද යන්න දැන ගැනීම සඳහා වාහනයට ඇතුල්වීම හෝ වාහනය සෝදිසි කිරීම කළ හැකිය,

(2) (i) මගී හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා අදාළ වාහනයට අධිකාරිය විසින් නිකුත් කර ඇති අවසර පත්‍රය හෝ එකී වාහනය වෙනුවෙන් ප්‍රදානය කරන ලද වෙනත් යම් ලේඛනයක් හෝ ඉදිරිපත් කරන ලෙසට එම වාහනයේ රියැදුරුට, කොන්දොස්තරට හෝ රිය සහයකයාට හෝ භාරව සිටින්නාට නියම කළ හැක. නැතහොත්,

(ii) ඒ අවසර පත්‍රය හෝ වෙනත් ලේඛන හෝ එහි පිටපත් තමන්ගේ භාරයට ගත හැකිය. එවැනි යම් ලේඛනයක් භාරගන්නා අවස්ථාවේදී ඒ සඳහා ලදුපතක් ලබා දිය යුතුය.

(3) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන රියැදුරු බලපත්‍රය, වාර්ෂික ආදායම් බලපත්‍රය, අදාළ යැයි හැඟෙන වෙනත් ලියකියවිලි පරීක්‍ෂා කළ හැකිය.

50. (1) (i) අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි කියනු ලබන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව නැතහොත්, නඩු පවරනු ලැබීමෙන් ආරක්‍ෂාව.

(ii) අධිකාරියේ යම් සාමාජිකයෙකු නිලධරයෙකු හෝ සේවකයෙකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ අධිකාරියේ විධානය පිට සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතුය.

(2) අධිකාරියට එරෙහිව වූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය. එවැනි සිවිල් හෝ අපරාධ නඩුවකින් අධිකාරිය විසින් අයකර ගනු ලබන යම් වියදමක් හෝ වන්දියක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතුය. අදාළ වරද සම්බන්ධයෙන් නිලධාරියා පෞද්ගලිකව වගකීමට බැඳී සිටී නම් අදාළ මුදල අධිකාරියේ අරමුදලින් ගෙවීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ බලය අධ්‍යක්‍ෂ මණ්ඩලය සතු වන්නේය.

51. (1) අධිකාරිය විසින් බලය පවරනු ලැබූ යම් නිලධාරියකු විසින් හෝ මේ ප්‍රඥප්තිය යටතේ වන අවසර පත්‍රයක අධිකාරය යටතේ මගීන් හෝ භාණ්ඩ ප්‍රවාහනය කරන මෝටර් රථයකට අදාළ මෙම ප්‍රඥප්තියේ නියමිත විධිවිධාන කිසිවක් කඩකර ඇති විටකදී එකී කඩ කිරීම ස්ථානීය සේවා ගාස්තුවක් නියම කළ හැකි කඩ කිරීමක් නම් එකී කඩ කිරීම පිළිබඳ වගකීම සිය කැමැත්තෙන් පිළිගන්නා යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීම වෙනුවට වලංගුව පවතින්නා වූ උපරිම ස්ථානීය සේවා ගාස්තුවකට යටත්ව සේවා ගාස්තුව නියම කරනු ලැබිය හැකිය, ඒ පිළිබඳව බලය පවරනු ලැබූ නිලධාරියා විසින් හෝ එකී නිලධාරියා විසින් බලය පවරන ලද වෙනත් සුදුසු නිලධාරියෙකු සුදුසු පරිදි ධාවන මාර්ගය හා මෝටර් වාහනයේ අංකය ද සහිතව අධිකාරියට දැන්විය යුතුවේ. ස්ථානීය සේවා ගාස්තු.

(2) එවැනි ස්ථානීය සේවා ගාස්තුවක් අධිකාරිය වෙත හෝ අධිකාරියේ උප කාර්යාලයකට අධිකාරියේ අරමුදලට බැර වන සේ ගෙවා, ගෙවීම් සාක්ෂි වශයෙන් වරද සොයා ගත් දින සිට දෙසතියක් තුළ අදාළ ලදුපත අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

52. හුදෙක්ම මගී ප්‍රවාහන සේවාවේ උන්නතිය සලකා යෝග්‍ය අවස්ථාවන්හිදී පොදු රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව බස්රථ මිලදී ගැනීම සඳහා පහසුකම් සහ බදු, සහන ලබාදීම සඳහා අධිකාරිය විසින් නිර්දේශ නිකුත් කළ හැකිය. බස්රථ මිළට ගැනීම සඳහා සහ නිර්දේශ කිරීම.

53. (1) අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්ය සඳහා නියෝග සාදනු ලැබිය හැකිය. ප්‍රඥප්තිය යටතේ නියෝග සෑදීම.

(2) ඉහත (1) වන උපවගන්තිය මගින් පිරිනමනු ලබන බලතලවල පොදුභාවයට අගතියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් පහත සඳහන් සියලු හෝ එක් එක් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

(i) මේ ප්‍රඥප්තිය යටතේ නියෝග සෑදීම සඳහා නියමිත හෝ බලය දෙනු ලබන සියලු කාරණා,

(ii) අවසර පත්‍ර සහ වෙනත් අධිකාරි බලපත්‍රනිකුත් කිරීම, අළුත් කිරීම, සංශෝධනය කිරීම, අයිතිවාසිකම් පැවරීම හා ඒ සම්බන්ධ වන ආනුශාංගික කටයුතුවලදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සහ භාවිතා කළ යුතු ආකෘති සහ ගෙවිය යුතු ගාස්තු නියම කිරීම ;

(iii) මාර්ගවල යෝග්‍යතාවය සහ භාවිතය අනුව එකී මාර්ගයන්වල ගාස්තු මත මගී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා පාවිච්චි කළ යුතු මෝටර් වාහන නියම කිරීම සහ එකී මෝටර් වාහන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පිළිපැදිය යුතු සම්මතයන් නියම කිරීම ;

(iv) අවසර පත්‍රයක බලය යටතේ යොදාගනු ලබන වාහනයක රියදුරු, කොන්දොස්තර, රිය සහායක හෝ වාහනය භාරව සිටින තැනැත්තා විසින් රැගෙන යා යුතු ලේඛන සහ ඒවායේ ඇතුළත්විය යුතු සහ ඇතුළත් කළ යුතු විස්තර,

(v) නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස්රථ වල ගමන් වාර සම්බන්ධයෙන් තබා ගත යුතු වාර්තා,

(vi) අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන වාහනයක් පාවිච්චි කරනු ලබන යම් තැනැත්තෙකු විසින් පිළිපැදිය යුතු සම්මතයන්,

(vii) නිත්‍ය මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍ර දරන්නන් විසින් ඒවා අවසර පත්‍රවල බලය යටතේ යොදා ගනු ලබන බස්රථවල රියදුරන්, කොන්දොස්තරවරුන් හා රිය සහයකයන් ලෙස සේවා නියුක්ත කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන හා අවසන් කරන වේලාව සහ ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් සම්බන්ධයෙන් ඒ අවසර පත්‍ර දරන්නන් විසින් තබාගත යුතු වාර්තා.

(viii) එසේ තබාගනු ලබන වාර්තා සුරක්ෂිතව තබා ගැනීම, අධිකාරිය විසින් බලය දෙන ලද තැනැත්තෙකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම සහ එසේ බලය දෙන ලද තැනැත්තෙකු විසින් ඉල්ලා සිටින විට ඒ වාර්තා පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

(ix) අවසරපත්‍රවල අධිකාරිය යටතේ මගී ප්‍රවාහනයේ හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙන රියදුරන් කොන්දොස්තරවරුන් සහ රිය සහයකයන් ලියාපදිංචි කිරීම. එම ලියාපදිංචිය අළුත් කිරීම්, අවලංගු කිරීම් සහ අත්හිටුවීම් සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය සැකසීම.

(x) අවසර පත්‍රවල අධිකාරිය යටතේ නිත්‍ය මගී ප්‍රවාහන සේවයේ යෙදෙන මෝටර් වාහනවල රියදුරන් සහ කොන්දොස්තරවරුන් විසින් පැළඳ සිටිය යුතු නිළ ඇඳුම් සහ ලාංඡන නියම කිරීම, එම වාහනවල රියදුරන් සහ කොන්දොස්තරවරුන් මගී ප්‍රවාහනයේ යෙදෙන අවස්ථාවල දී ඔවුන් විසින් අනුගමනය කළ යුතු විනය නීති නියම කිරීම.

(xi) විශේෂයෙන්ම බස් ධාවනය ඒකාබද්ධ කිරීම හා වේලාවන් සටහන් කිරීම සහ පහසුකම් නිසි පරිදි සහ සාධාරණ ලෙස සැලසීම සඳහා බස්රථ ගාල් , බස් නැවතුම්පොලවල් හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන කළමනාකරණය කිරීම සම්බන්ධව

(xii) පළාත තුළ මගී ප්‍රවාහන අවසර පත්‍රයක් හෝ යම් අධිකාරි බලයක් යටතේ ධාවනය කරනු ලබන පාසැල් වෑන්රථ, ත්‍රිරෝද රථ, කුලී රථ සඳහා වෙනත් නීතියක් යටතේ ආවරණය නොවන මගී ප්‍රවාහන සේවා සඳහා අය කළ යුතු ගාස්තු නියම කිරීම, නිශ්චය කිරීම හා ඒවා සංශෝධනය කිරීම

(xiii) නිත්‍ය මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා සහ විශේෂ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රවල බලය යටතේ යොදා ගනු ලබන රියදුරන්ගේ හා කොන්දොස්තරවරුන්ගේ අවම සුදුසුකම් නියම කිරීම සහ ඔවුන්ගේ ශාරීරික සහ මානසික යෝග්‍යතා කළින් කළ පරීක්ෂණයට භාජනය කරවීම.

(xiv) අන්තර් පළාත් බලපත්‍රලාභී බස්රථ මධ්‍යම පළාත තුළ මගී ප්‍රවාහනයේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හා ගාස්තු අය කිරීම පිළිබඳව රෙගුලාසි පැනවීම ;

(3) මෙකී 1 වැනි උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනක හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) මෙබී (1) වැනි උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ඒවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසු මසක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමෙන් පසු අනුමත නොකරන ලද යම් නියෝගයක් වෙතොත් එය යටතේ කළින් කරන ලද ක්‍රියාවකට හානියක් නොමැතිව අනනුමත දින සිට එම නියෝගය පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) පරිච්ඡින්න කරනු ලැබූ යම් නියෝගයක් වෙතොත් එකී පරිච්ඡින්න කරනු ලැබූ නියෝගය, පරිච්ඡින්න කරනු ලැබූ දිනය ද සමග *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

## VII වැනි කොටස

### වරදවල් හා දඬුවම්

54 (1) (i) බස්රථයේ වලංගු ප්‍රවේශ පතක් සහිතව ගමන් කරන මගියෙකුට පීඩාකාරි හෝ අපහාස වන කිසියම් ආකාරයේ යම් අසභ්‍ය අශෝභන හෝ ආවේගශීලී භාෂාවක් හෝ අභිනයක් හෝ හැසිරීමක් භාවිතා කරන හෝ සිදුකරන එකී බස්රථයේ රියදුරකු හෝ කොන්දොස්තරවරයකු වන තැනැත්තෙකු, වැරදි

(ii) මගීන් ප්‍රවාහනය කරනු ලබන බස්රථයක වූ අභ්‍යන්තරික ශබ්ද ජනක යන්ත්‍ර හෝ උපකරණවල ශබ්ද මට්ටම අධිකාරිය විසින් නියම කරනු ලබන ශබ්ද මට්ටම ඉක්මවනු ලබන අවස්ථාවක එකී බස්රථයේ අවසර පත්‍රය දරන්නෙකු රියදුරෙකු හෝ කොන්දොස්තරවරයෙකු,

(iii) රියදුරෙකු හෝ කොන්දොස්තරවරයෙකු හෝ සහායකයෙකු ලෙස නිසි පරිදි අධිකාරියේ ලියාපදිංචි නොවී හෝ එසේ ලියාපදිංචි වුව ද එම ලියාපදිංචිය අවලංගුව පවතින අවස්ථාවක අධිකාරිය විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මගී ප්‍රවාහනයේ හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යෙදන ඕනෑම තැනැත්තෙකු,

(iv) (අ) අධිකාරියේ අවසරය මත හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් ප්‍රවේශ පත්‍රයක් වංචා සහගත ලෙස පාවිච්චි කරනු ලබන හෝ ඒ සඳහා වෙනත් තැනැත්තෙකුට ඉඩ දෙනු ලබන,

(ආ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක් වංචා සහගත ලෙස අනුකරණය කරන, ස්වභාවය වෙනස් කරන, විකෘති කරන හෝ විනාශ කරනු ලබන,

(ඇ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක් අධිකාරියේ අවසරය නොමැතිව විකුණන, සපයන හෝ බෙදාහරින හෝ අලවිය සඳහා ඉදිරිපත් කරනු ලබන,

(ඈ) අවසරය නොමැතිව එවැනි ප්‍රවේශ පත්‍රයක් ලෙස මුද්‍රණය කරන ලදැයි අදහස් කරන හෝ පාවිච්චි කරන ලද යම් ප්‍රවේශ පත්‍රයක් මුද්‍රණය කරන,

(ඉ) අධිකාරියේ අවසරය මත හෝ ඒ යටතේ නිකුත් කරන ලද වලංගු ප්‍රවේශ පතක් නිකුත් නොකර මගීන් ප්‍රවාහනය කරන තැනැත්තෙකු,

(v) අධිකාරියට අයත් බස් නැවතුම්පලක පිහිටි හෝ වෙනත් ස්ථානයක පිහිටි ගොඩනැගිල්ලක හෝ මගී ආවරණයක හෝ අධිකාරියේ අවසරයකින් තොරව දැන්වීම් ප්‍රදර්ශණය කරන දැන්වීම් අලවන හෝ අකුරු, පාඨ, වචන ලිවීමෙන් හෝ රූප හෝ ඡායාරූප හෝ වෙනත් සලකුණු ඇඳීමෙන් දැන්වීම් ප්‍රදර්ශණය කරන හා ඕනෑම අයුරකින් හිතාමතාම අපවිත්‍ර කරනු ලබන තැනැත්තෙකු

මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවන අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේදී එම තැනැත්තා රුපියල් විසි දහසකට නොඅඩු දඩයකට හෝ මාස හයක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

එසේ වුව ද, අධිකාරිය විසින් නියම කරනු ලබන ස්ථානීය සේවා ගාස්තුවක ගෙවා ඇති තැනැත්තෙකු සම්බන්ධයෙන් ඉහත වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුත්තේ ය.

(2) අධිකාරිය විසින්නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ හෝ වෙනත් කිනම් හෝ අධිකාරියක් යටතේ මගී ප්‍රවාහනයේ යෙදෙන බස්රථයක දි ,

(i) අධිකාරිය විසින් හෝ වෙනත් ආයතනයක් විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක්, ගමන් බලපත්‍රයක් හෝ අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ යම් අධිකාරයක් නොමැතිව ගමන් කරන,

(ii) ඒ ගමන් වාරය සඳහා තමාට නිකුත් කළ ප්‍රවේශ පත්‍රය ගමන ගමානාරම්භයේ සිට අවසානය දක්වා ඔහු සතුව රඳවා නොගන්නා හෝ,

(iii) ඒ බස්රථයේ කොන්දොස්තරවරයා විසින් හෝ තත්කාලය සඳහා අධිකාරිය විසින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තෙකු විසින් ඉල්ලා සිටි විට ඒ ප්‍රවේශ පත්‍රය පෙන්වීම හෝ භාරදීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන, යම් මගියකු

මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවන අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා රුපියල් දස දහසකට නොඅඩු දඩයකට හෝ මාස තුනක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

එසේ වුව ද, අධිකාරිය විසින් නියම කරනු ලබන ස්ථානීය සේවා ගාස්තුවක් ගෙවා ඇති තැනැත්තෙකු සම්බන්ධයෙන් ඉහත වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුත්තේ ය.

(3) අධිකාරිය විසින් හෝ වෙනත් කිනම් හෝ ආයතනයක් මගින් නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක අධිකාරය යටතේ මගී ප්‍රවාහනයේ යෙදෙන බස්රථයක ගමන් කරන මගියෙක්,

(i) ඔහුගෙන් අයවිය යුතු ගාස්තු ගෙවීම පැහැර හරි නම්,

(ii) ස්වකීය ගමනාන්තයට පැමිණි විට බස්රථයෙන් බැසීම හිතාමතාම ප්‍රතික්ෂේප කරයි නම් හෝ පැහැර හරි නම්,

(iii) කිසියම් තැනැත්තෙකුට පීඩාකාරි හෝ අපහාස වන කිසියම් ආකාරයේ යම් අසභ්‍ය අශෝභන හෝ ආවේගශීලි භාෂාවක් හෝ අභිනයක් හෝ හැසිරීමක් භාවිතා කරන හෝ සිදු කරයි නම් ,

මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවන අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා රුපියල් දස දහසකට නොඅඩු දඩයකට හෝ මාස තුනක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

එසේ වුව ද, අධිකාරිය විසින් නියම කරනු ලබන ස්ථානීය සේවා ගාස්තුවක් ගෙවා ඇති තැනැත්තෙකු සම්බන්ධයෙන් ඉහත වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුත්තේය.

(4) මෙම ප්‍රඥප්තියේ ඉහත (1), (2), (3) යන උපවගන්ති යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරනු ලබන ඕනෑම තැනැත්තෙකු ඕනෑම පොලිස් නිලධරයෙකු විසින් නීත්‍යානුකූල ආකාරයට අත්අඩංගුවට ගනු ලැබිය හැකි අතර, එසේ අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තා වහාම නීතියට අනුව ක්‍රියා කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියට පැමිණවීමට ක්‍රියා කළ යුතු ය. වරදකරුවන් අත් අඩංගුවට ගැනීම

55. හිතාමතාම අධිකාරිය වෙත ව්‍යාජ හෝ සාවද්‍ය විස්තර ඇතුළත් යම් වාර වාර්තාවක් ලිඛිත තොරතුරක් හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවන අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා රුපියල් දස දහසකට නොඅඩු දඩයකට හෝ මාස තුනක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය. සාවද්‍ය වාර්තා ඉදිරිපත් කිරීම.

56 (1) අනවසරයෙන් බස් නැවතුම්පොලවලින් මගීන් ගැනීම හෝ පැටවීම, ඊට සහය වීමට මගීන් එක්රැස් කිරීමේ අරමුණින් ශබ්ද නගා කෑගැසීම, අධිකාරියේ නිලධාරින්ගේ රාජකාරි කටයුතුවලට බාධා හෝ අවහිර වන ලෙස කටයුතු කිරීම, දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට හෝ අධිකාරියේ නිලධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේදී එම තැනැත්තා රුපියල් දස දහසකට නොඅඩු දඩයකට හෝ මාස තුනක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය. බස්රථ නැවතුම් ස්ථාන

(2) අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් නොමැතිව මගීන් ප්‍රවාහනය කිරීම නොකළ යුතු අතර, එසේ කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි අවස්ථාවක පොලිස් නිධාරීන්ට හෝ අධිකාරියේ නිලධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේදී එම තැනැත්තා රුපියල් විසි දහසකට නොඅඩු දඩයකට හෝ මාස හයක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය. අවසර පත්‍ර නොමැතිව ධාවනය

(3) (i) අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් නොමැතිව පාසල් සේවා කර්මාන්තශාලා හෝ සේවා ස්ථාන සඳහා සේවකයින් ප්‍රවාහනය කිරීම නොකළ යුතු අතර, එසේ කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි අවස්ථාවක පොලිස් නිළධාරීන්ට හෝ අධිකාරියේ නිලධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේදී එම තැනැත්තා රුපියල් දස දහසකට නොඅඩු දඩයකට හෝ මාස තුනක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය. වෙනත් පොදු මගී ප්‍රවාහන සේවා

(ii) අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් නොමැතිව ත්‍රිරෝද රථවලින් මගීන් ප්‍රවාහනය කිරීම නොකළ යුතු අතර, එසේ කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි අවස්ථාවක පොලිස් නිධාරීන්ට හෝ අධිකාරියේ නිධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේදී එම තැනැත්තා රුපියල් දස දහසකට නොඅඩු දඩයකට හෝ මාස තුනක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

භාණ්ඩ ප්‍රවාහන සේවා

(4) අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් නොමැතිව භාණ්ඩ ප්‍රවාහනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට හෝ අධිකාරියේ නිලධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේදී එම තැනැත්තා රුපියල් දස දහසකට නොඅඩු දඩයකට හෝ මාස තුනක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

අධිකාරියට බාධා කිරීම බලපෑම් කිරීම.

57. අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරිය වෙත පවරා ඇති බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේ දී හෝ අධිකාරිය විසින් බලය පවරන ලද නිධරයකු විසින් එසේ බලය පවරන ලද කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී ඊට නීති විරෝධි ලෙසින් බාධා පමුණුවන, මැදිහත් වන, එරෙහි වන හෝ බලපෑම් කරන තදනන්තර ප්‍රතිරෝධය පාන නැතහොත් එසේ කිරීමට උත්සහ දරන ඕනෑම තැනැත්තකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයෙන් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසකට නොඅඩු දඩයකට හෝ අවුරුදු එකකට නොඅඩු දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය.

සාමාන්‍ය දණ්ඩන

58. මේ ප්‍රඥප්තියේ යම් විධානයක් හෝ ඒ යටතේ පනවන ලද, නිකුත් කරන ලද හෝ දෙන ලද යම් නියෝගයක්, නියමයක්, විධානයක් උල්ලංඝණය කරමින් කටයුතු කරන යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අතර, එකී වරද මෙම ප්‍රඥප්තිය මගින් විශේෂ දණ්ඩනයක් ලෙස සලකනු නොලැබ ඇති වරදක් වන අවස්ථාවකදී මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේදී එම තැනැත්තා රුපියල් දස දහසකට නොඅඩු දඩයකට හෝ මාස තුනක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

නඩු පැවරීම සඳහා බලය දීම.

59. (1) මෙම ප්‍රඥප්තිය යටතේ වූ වැරදි සම්බන්ධයෙන් නඩු කටයුතු පැවරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් ලියවිල්ලක් මගින් බලය දෙනු ලැබූ නිලධරයෙකු හෝ සේවකයෙකු 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 136 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ නිලධරයෙකු ලෙස සැලකිය යුතු ය.

## **VIII** වැනි කොටස

### ඉවත් කිරීම සහ අන්තර්කාලීන විධිවිධාන

ඉවත් කරන ලද ප්‍රඥප්ති යටතේ රෙගුලාසි (නියෝග)

60. අමාත්‍යවරයා විසින් වෙනත් අයුරකින් තීරණය කරන තෙක් 1992 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය යටතේ ද 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්ති යටතේ ද සාදනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සහ රෙගුලාසි මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට පටහැනි නොවන්නේ නම් මෙම ප්‍රඥප්තිය යටතේ රෙගුලාසි පනවන තෙක් වලංගු නියෝග සහ රෙගුලාසි ලෙස තවදුරටත් බලපැවැත්විය යුතුය.

61. එසේ වුවද අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ 04 වන වගන්තිය යටතේ අධිකාරියේ සාමාජිකයින් පත් කරන තුරු මධ්‍යම පළාතේ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබ මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පූර්වාසන්නයෙන් වූ දිනය දක්වා 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සාමාජික ධූර දරන ලද සියළුම සාමාජිකයන් මෙම ප්‍රඥප්තිය යටතේ පත්කරන ලද අධිකාරියේ සාමාජිකයින් ලෙස සැලකිය යුතු වන්නේය.

අධිකාරියේ සේවා නියුක්තයන්

62. (1) නියමිත දිනයට පෙරාතුව වූ දිනයේදී 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්ති යටතේ සේවයේ නියුක්ත සියලු නිලධාරීන් හා වෙනත් සේවා නියුක්තයන් ඔවුන් එකී මගී ප්‍රවාහන සේවා අධිකාරිය යටතේ වූ සේවා නියුක්තියට සම්බන්ධ නියමයන් හා කොන්දේසිවලට වඩා වාසිදායක භාවයෙන් නොඅඩු නොවන්නා වූ නියමයන් හා කොන්දේසිවලට යටත්ව අධිකාරියේ සේවාවේ සේවා නියුක්තයන් ලෙස සලකනු ලැබිය යුතු ය. එම සේවා නියුක්තයන්ගේ සේවය ඔවුන්ගේ සේවා නියුක්තිය පිළිබඳව නීත්‍යානුකූල හේතු මත හැර වෙනත් ආකාරයකට අවසන් කරනු නොලැබිය යුතු ය.

(2) නියමිත දිනයට පෙරාතුව වූ දිනයේදී 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත එකී අධිකාරිය සතු සියලුම අරමුදල්ද ඇතුළුව එකී අධිකාරියේ සියලු නිශ්චල සහ චංචල දේපළ අධිකාරිය වෙත සතු කළ යුතු අතර, එකී සියලු දේපල අධිකාරියේ දේපළක් විය යුතුය.

ගිවිසුම් අයිතිවාසිකම් බැඳීම් වගකීම් සහ පවරා ඇති සහ පවතින නඩු සඳහා වූ ප්‍රතිපාදන.

(3) නියමිත දිනයට පෙරාතුව වූ දිනයේදී බලාත්මකව පවතින 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත මධ්‍යම පළාතේ මගී සේවා අධිකාරිය විසින් එළඹ ඇති සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්ති භාරකාර අරමුදල සහ පාරිතෝෂික සම්බන්ධ සියලු බැඳීම් සහ වගකීම් ඇතුළු සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් අධිකාරියේ කොන්ත්‍රාත් සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතුය.

(4) නියමිත දිනයට පෙරාතුව වූ දිනයේදී යම් අධිකරණයක හෝ විනිශ්චය සභාවක 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් හෝ එම අධිකාරියට විරුද්ධව පවරා ඇති හෝ ඉදිරිපත් කර ඇති නඩුවක්, ඉල්ලීමක් හෝ අභියාචනයක් අධිකාරිය විසින් හෝ එයට විරුද්ධව පවරා ඇති හෝ ඉදිරිපත් කරන ලද නඩුවක්, ඉල්ලීමක් හෝ අභියාචනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒවා පවත්වාගෙන යාම හෝ අවසන් කරනු ලැබීම කළ හැකිය.

(5) නියමිත දිනයට පෙරාතුව වූ දිනයේදී 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් හෝ ඊට එරෙහිව පවරා ඇති හෝ ඉදිරිපත් කර ඇති යම් නඩුවකදී ඉල්ලීමකදී හෝ අභියාචනයකදී අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරියක් විසින් වාර්තා ගත කොට ඇති හෝ ප්‍රදානය කරනු ලැබ නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේදීම එය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ඉටුකර නොමැතිව ඉතිරිව පවතින යම් තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් අවස්ථාවෝචිත පරිදි අධිකාරියට වාසියට හෝ එයට එරෙහිව වාර්තා ගත කොට ඇති හෝ ප්‍රදානය කරන ලද තීන්දු ප්‍රකාශයක් බවට හෝ ප්‍රදානයක් බවට හෝ සලකනු ලැබිය යුතු අතර, සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධානවලට හෝ තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් ක්‍රියාවේ යෙදවීමට අදාළ වෙනත් යම් ප්‍රඥප්තියකට යටත්ව අධිකාරිය විසින් හෝ එයට එරෙහිව ක්‍රියාවේ යෙදිය හැකිය.

(6) 1992 අංක 04 දරන මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ හෝ 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද්දාවූ ද නැතහොත් එකී ප්‍රඥප්තිය යටතේ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබුවාවූ ද මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දිනට පූර්වාසන්නයේ වලංගුව ඇත්තාවූද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් හෝ වෙන යම් ලියකියවිල්ලක් මෙම ප්‍රඥප්තිය යටතේ කළින් නිකුත් කර අවලංගු කරනු නොලැබුවහොත් එකී සඳහන් වලංගු කාලය තුළ මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

63. මෙම ප්‍රඥප්තිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

64. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

අර්ථ නිරූපනය.

"අමාත්‍යවරයා" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රවාහන සේවා විෂයභාර අමාත්‍යවරයා අදහස් වන්නේය,

"අමාත්‍ය මණ්ඩලය" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය අදහස් වන්නේය,

"පළාත" යන්නෙන් මධ්‍යම පළාත අදහස් වන්නේය.

"පළාත් සභාව" යන්නෙන් මධ්‍යම පළාත් සභාව අදහස් වන්නේය.

"නිලධාරියා" යන්නෙන් මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් ඇතුලුව අධිකාරියේ සේවය කරන සියලු සේවකයින් අදහස් වන්නේය.

"ජ්‍යෙෂ්ඨ නිලධාරියකු" යන්නෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියට නොඅඩු ධූරයක නිලධාරියෙකු හෝ ඒ හා සමාන්තර සේවාවල ඒ හා සමාන නිලයක් දරන අයකු අදහස් වන්නේය.

"අවසර පත්‍රය" යන්නෙන් "මගී සේවා අවසර පත්‍රය", "භාණ්ඩ සේවා අවසර පත්‍රය", "විශේෂ සේවා අවසර පත්‍රය", "මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය", "මාර්ග බලපත්‍රය" හා "නිත්‍ය ප්‍රවාහන සේවා අවසර පත්‍රය", "පාසැල් සේවා අවසර පත්‍රය", "කර්මාන්ත ශාලා ප්‍රවාහන සේවා අවසර පත්‍රය", යන නම්වලින් කුමන හෝ නමකින් මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ ගාස්තුවක්, ත්‍යාගයක්, ප්‍රතිලාභයක් හෝ වෙන් වෙන් ගාස්තු මත මෝටර් වාහනයක් මගින් මගී ප්‍රවාහනයේ හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යොදා ගැනීම සඳහා බලය දෙමින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වන්නේය.

"ප්‍රවාහන සේවා" යන්නෙන් මගීන් හෝ භාණ්ඩ ප්‍රවාහනය කරන කුමන හෝ වාහනයක් අදහස් වේ.

"බස් නැවතුම්පොල" යන්නෙන් මධ්‍යම පළාත තුළ පිහිටි බස් මගී පර්යන්ත යනුවෙන් අදහස් විය යුතු අතර, 2003.05.31 දිනැති අංක 1291 ගැසට් පත්‍රය මගින් ගැසට් කරන ලද මධ්‍යම පළාත තුළ පිහිටි බස්රථ ගාල්, අධිකාරිය සතු මධ්‍යම පළාත තුළ පිහිටි බස් නැවතුම්පොලවල් හා මහ මග' දෙපස බස් නවත්වන ස්ථානද ඇතුළත් විය යුත්තේය.

"ගැසට් පත්‍රයේ" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අදහස් වන්නේය.

"පළාත් පාලන ආයතන" යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක් , සුළු නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන්නේය.

"බස්රථය හා ඔම්නි බස් රථය" යන්නෙන් මෝටර් රථවාහන පනත යටතේ ඔම්නි බස්රථයක් වශයෙන් ලියාපදිංචි කරන ලද මෝටර් කෝච් රථයක් අදහස් වන අතර, ඊට ද්විත්ව කාර්ය වාහනයක්ද, ඇතුළත් වන සේ සලකනු ලැබිය යුතුය.

"මගියා" යනු කුලී රථයක හෝ බස්රථයක, පාසල් සේවා බස්රථයක හෝ වැන් රථයක, කර්මාන්ත ශාලා බස්රථයක හෝ වැන් රථයක ප්‍රවාහනය කෙරෙන එහෙත් රියදුරු හා බස්රථයක නම් කොන්දොස්තරවරයා/රිය සහායක ඇතුළත් නොවන පුද්ගලයකි.

"වෙන් වෙන් ගාස්තුව" යන්නෙන් බස්රථයක මගියකු වශයෙන් ගෙන යනු ලැබීමට යම් තැනැත්තෙකුට හිමිකම් ලබා දෙන ඒ තැනැත්තා විසින් කරනු ලබන ගෙවීම අදහස් වේ.

"මෝටර් වාහනය" යන්නෙන් මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපනය කර ඇති මෝටර් වාහනයක් අදහස් වේ.

"මෝටර් රථය" යන්නෙන් මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපනය පරිදි මෝටර් වාහනයක් අදහස් වේ.

"ලොරිය" යන්නෙන් මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපනය කර ඇති මෝටර් වාහනයක් අදහස් වේ.

"ට්‍රේලරය" යන්නෙන් මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපනය කර ඇති ට්‍රේලරයක් අදහස් වේ.

"කුලී ධාවනය" යන්නෙන් මහා මාර්ගයක හෝ වෙනත් ස්ථානයක මගීන්ට කුලියට දීම සඳහා නවතා තබන හෝ නතර කර තැබීම හෝ ධාවනය කිරීම අදහස් වේ.

"මගී ප්‍රවාහන සේවාව" යන්නෙන් මහා මාර්ග ඔස්සේ ගාස්තුවක් අය කරමින් පාසල් සිසුන්, කාර්යාල සේවකයින් ඇතුළු අනෙකුත් මගීන් ප්‍රවාහනය කරනු ලබන සෑම වාහනයක්ම අදහස් වේ.

විධිමත් බඳවා ගැනීමේ පටිපාටිය යනුවෙන් අදහස් වන්නේ රජයේ කළමණාකාරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරනු ලබන බඳවා ගැනීමේ පටිපාටිය වේ.

මහනුවර දිස්ත්‍රික්කය

| අනු අංකය | බස් නැවතුම්පළ | වර්ග ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| | | අක්. | රූඩ් | පර්. |
| 1 | බෝගම්බර බස්රථ නැවතුම්පළ | | | |
| 2 | දෙල්තොට බස්රථ නැවතුම්පළ | 0 | 2 | 17.06 |
| 3 | අම්පිටිය බස්රථ නැවතුම්පළ | 0 | 0 | 24.27 |
| 4 | නාවලපිටිය බස්රථ නැවතුම්පළ | 0 | 2 | 27.81 |
| 5 | තලාතුඔය බස්රථ නැවතුම්පළ | | 1 | 17.34 |
| 6 | අංකුඹුර බස්රථ නැවතුම්පළ | 0 | 0 | 17.68 |
| 7 | පන්විල බස්රථ නැවතුම්පළ | 0 | 1 | 6.93 |
| 8 | ගෙලිඔය බස්රථ නැවතුම්පළ | 0 | 3 | 12.76 |
| 9 | වැලිගල්ල බස්රථ නැවතුම්පළ | 0 | 0 | 21.51 |
| 10 | ගම්පළ බස්රථ නැවතුම්පළ | 0 | 2 | 27.77 |
| 11 | ගුඩ්ෂෙඩ් ප්‍රධාන බස්රථ නැවතුම්පළ | 2 | | 31.45 |
| 12 | පොත්තපිටිය බස්රථ නැවතුම්පළ | 0 | 0 | 36.13 |
| 13 | ගුඩ්ෂෙඩ් පෞ. බස්රථ නැවතුම්පළ | 0 | 0 | 29.22 |
| 14 | වත්තේගම බස්රථ නැවතුම්පළ | 0 | 2 | 24.02 |
| 15 | පැණිදෙනිය බස්රථ නැවතුම්පළ | 0 | 0 | 4.03 |
| 16 | කඩුගන්නාව බස්රථ නැවතුම්පළ | 0 | 1 | 26.5 |
| 17 | හාරගම බස්රථ නැවතුම්පළ | 0 | 1 | 22.59 |
| 18 | කරල්ලියද්ද බස්රථ නැවතුම්පළ | 0 | 2 | 4.45 |
| 19 | දිගන බස්රථ නැවතුම්පළ | 2 | 2 | 25.13 |
| 20 | ඔරලෝසු කණුව බස්රථ නැවතුම්පළ | 0 | 2 | 36.95 |
| 21 | ටොරින්ටන් බස්රථ නැවතුම්පළ | | | 14.1 |
| 22 | පේරාදෙනිය බස්රථ නැවතුම්පළ | 0 | 0 | 29.24 |
| 23 | මහකන්ද බස්රථ නැවතුම්පළ | 0 | 0 | 4.78 |
| 24 | කටුගස්තොට බස්රථ නැවතුම්පළ | | | |
| 25 | බොක්කාවල බස්රථ නැවතුම්පළ | | 1 | 5.7 |
| 26 | මැණික්හින්න බස්රථ නැවතුම්පළ | 0 | 0 | 28.07 |
| 27 | අලවතුගොඩ බස්රථ නැවතුම්පළ | 0 | 0 | 7.98 |
| 28 | පොල්ගොල්ල බස්රථ නැවතුම්පළ | 0 | 0 | 10.6 |
| 29 | හසලක බස්රථ නැවතුම්පළ | 0 | 2 | 21.05 |
| 30 | ගංහත බස්රථ නැවතුම්පළ | 0 | 0 | 17.16 |
| 31 | පුස්සැල්ලාව බස්රථ නැවතුම්පළ | | | 18.78 |
| 32 | ගලගෙදර බස්රථ නැවතුම්පළ | 0 | 1 | 7.57 |
| 33 | මැදවල බස්රථ නැවතුම්පළ | 0 | 0 | 26.73 |
| 34 | අමුණුගම  බස්රථ නැවතුම්පළ | 0 | 0 | 26.73 |

## නුවරඑළිය දිස්ත්‍රික්කය

| අනු අංකය | බස් නැවතුම්පළ | වර්ග ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| | | අක්. | රූඩ් | පර්. |
| 1 | මස්කෙළිය බස්රථ නැවතුම්පළ | 0 | 1 | 19.82 |
| 2 | සාමිමලේ බස්රථ නැවතුම්පළ | 0 | 0 | 29.89 |
| 3 | තලවාකැලේ බස්රථ නැවතුම්පළ | 0 | 1 | 34.6 |
| 4 | ඩයගම බස්රථ නැවතුම්පළ | 0 | 1 | 1.07 |
| 5 | හැටන් බස්රථ නැවතුම්පළ | | | |
| 6 | නිල්දණ්ඩාහින්න බස්රථ නැවතුම්පළ | 0 | 2 | 18.96 |
| 7 | නුවරඑළිය බස්රථ ගාල | 1 | 2 | 7.33 |
| 8 | හඟුරන්කෙත බස්රථ නැවතුම්පළ | 0 | 2 | 13.55 |
| 9 | වලපනේ බස්රථ නැවතුම්පළ | 0 | 3 | 20.03 |
| 10 | රාගල බස්රථ නැවතුම්පළ | | | |
| 11 | නල්ලතන්නිය බස්රථ නැවතුම්පළ | | | |
| 12 | පූඩළුඔය බස්රථ නැවතුම්පළ | 0 | 0 | 13.48 |
| 13 | ගිනිගත්හේන බස්රථ නැවතුම්පළ | 0 | 0 | 31.94 |
| 14 | කොත්මලේ බස්රථ නැවතුම්පළ | 0 | 2 | 15.36 |
| 15 | නුවරඑළිය පුද්ගලික බස්රථ නැවතුම්පළ | 0 | 1 | - |

## මාතලේ දිස්ත්‍රික්කය

| අනු අංකය | බස් නැවතුම්පළ | වර්ග ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| | | අක්. | රූඩ් | පර්. |
| 1 | නාඋල බස්රථ නැවතුම්පළ | 0 | 3 | 6.4 |
| 2 | රජවීදිය බස්රථ නැවතුම්පළ | 0 | 1 | 2.86 |
| 3 | හෙට්ටිපොළ බස්රථ නැවතුම්පළ | 1 | 0 | 23.69 |
| 4 | රත්තොට බස්රථ නැවතුම්පළ | | | |
| 5 | ගොන්ගාවෙල බස්රථ නැවතුම්පළ | 0 | 3 | 4.62 |
| 6 | නුගසෙවන බස්රථ නැවතුම්පළ | 0 | 1 | 13.8 |
| 7 | දඹුල්ල බස්රථ නැවතුම්පළ | 2 | 2 | 33.68 |
| 8 | ගලේවෙල බස්රථ නැවතුම්පළ | - | - | - |
| 9 | ලග්ගල බස්රථ නැවතුම්පළ | - | - | - |
| 10 | හෙට්ටිපොළ බස්රථ නැවතුම්පළ | - | - | 23.69 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.